# අභිලේඛන සාධක වලින් හෙලිවන පහළ කඳුකර ප්‍රදේශයේ මුල් ඓතිහාසික යුගයේ සමාජ ආර්ථික පදනම පිළිබඳ අධ්‍යනයක්

එම්.පී.සී.එස්. මධුශිකා[24]

ශ්‍රී ලංකාවේ මූල ඓතිහාසික යකඩ යුගයේ සංස්කෘතිය වශයෙන් පිළිගැනෙන්නේ ආසන්න වශයෙන් ක්‍රි.පූ 9 වැනි සියවසේ සිට ක්‍රි.ව 3 වැනි සියවස පමණ දක්වා වූ කාලයක ක්‍රියාත්මක වූ තාක්ෂණික සංස්කෘතිය යි. පුරාවිද්‍යාඥයින්මෙහි අවසන් භාගය තුළ මුල් ඓතිහාසික යුගය ක්‍රියාත්මක වූ බව හඳුනාගෙන ඇත. ඓතිහාසික යුගයේ දී සංවිධිත සමාජයක් සහ පැහැදිලි අර්ථික රටාවක් මෙරට ක්‍රියාත්මක වූ බව පුරාවිද්‍යා පර්යේෂණ වලින් හෙලිවන අතර අධ්‍යයනය තුළින් මහනුවර තදාසන්න ප්‍රදේශයේ මුල් ඓතිහාසික යුගයේ සමාජ ආර්ථික පදනම හඳුනාගැනීමට අභිලේඛන අධ්‍යයනය සිදු කරනු ලැබේ.පහළ කඳුකර ප්‍රදේශය ආශ්‍රිතව මුල් ඓතිහාසික යුගයට අයත් පුරාවිද්‍යා සාධක රාශියක් දක්නට ඇත.මුල් බ්‍රහ්මීය ශිලා ලිපි, ශිලා ලිපි සහිත කාටාර කෙටූ ලෙන්, පැරණි බ්‍රහ්මීය අක්ෂර සහිත ගඩොල්,පැරණි ගොඩනැගිලි යන සාධක අභිලේඛනසාධක අතර ප්‍රධාන වේ. ශිලාලිපි ස්ථාන ගතවීම ජන කේන්ද්‍ර ගතවීමට ප්‍රබල සාධකයක් නොවූවත් ජන සංක්‍රමණ පිළිපඳ ඉඟි ඉන් සැපයේ.අභිලේඛන සාධකයන් ඔස්සේමෙකී ප්‍රදේශයේ සමාජ ආර්ථික පිරිස් පිළිබඳ ව විමර්ශනයට ලක් කිරිමේ දී බ්‍රාහ්මීය ලිපිවල සඳහන් වන්නා වූ සමාජ කණ්ඩායම් අතර **පරුමක,ගපති,බත,බරත** යන පිරිස් විශේෂය.ඊට අමතරව විවිධ තනතුරු නාම ද හඳුනාගත හැකි ය. එම නම් අතර **දඨික,චුඩ,කුබකර**,සහ විශේෂ නාම ලෙස **කුබර, උපාසිකා උපසක,තෙර,සිව,බමණ, පොචනි රජ,රජනා ගමණි** යන ආදී නාමද වැදගත් වේ.අධ්‍යයන ක්ෂේත්‍රයේ ස්ථාන ගත වූ මුල් බ්‍රාහ්මීය ශිලා ලිපි සහ කටාර කෙටූ ලෙන්වල ප්‍රාමාණිකභාවය ප්‍රාථමික යකඩ යුගය තුළ සුවිශේෂයක් දක්වයි.බඹරගල,ගො ලිපි මේ අතරින් වැදගත් වේ. මුල් ඓතිහාසික භාගයේ ජන කේන්ද්‍රගත වූ ප්‍රදේශයක් ලෙස හැදින්විය හැක්කේ විල්බාවෙන් හමුවන අපර බ්‍රාහ්මීය ලිපිය,පරපේ ප්‍රදේශයෙන් හමුවන මුල් බ්‍රහ්මීය ශිලා ලිපිය අනුව ආර්ථික කටයුතු ඉන් හෙළි වේ. වේගිරිය මුල් බ්‍රාහ්මීයශිලා ලිපියේ **ගපති,බත,කුමර,**යන ප්‍රභූ නාමයන් ද **මනිකර,කුබකර,දටික** වැනි විශේෂශිල්පින් පිළිබඳ දක්වා තිබේ. එමඟින් සමාජ ස්තරායනය හා තත් කාලීන සමාජ තොරතුරු හඳුනාගැනීමට හැකියාව ලැබේ. බඹරගල සහ ගෝනවත්ත හා හිඳගල ගංගාරාමය, සගම,අම්පිටිය,කෙවුල්ගම, හාරගම ලිපි අනුව මෙම ප්‍රදේශය ඉතිහාසය මුල් ඓතිහාසික යුගයේ දී දේශපාලන ආර්ථික සහ සමාජ පදනම අනුව වැදගත් වූ බව පෙන්වාදිය හැකි ය.

ප්‍රමුඛ පදඃ පොචනි රජ, මණිකර, කුබකර

[24]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය,ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, chandhimamadhuhshika@gmail.com.